# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2342/18 – 2023 ජූලි මස 25 වැනි අඟහරුවාදා – 2023.07.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39(1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 2254/40 හා 2021.11.19 වැනි දින දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ද, 2021 අංක 235 හා 2021.11.05 වැනි දින දරන ආඥාවේ සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. පහත විස්තර වන එම ඉඩම් කොටස්වල භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් මෙතෙක් භාරගෙන නොමැත. එබැවින්, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව අංක 2254/40 හා 2021.11.19 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 2021 අංක 235 හා 2021.11.05 වැනි දින දරන ආඥාවට අයත් පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/8/2020/UDA/252.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: WEG/LAN/L9/ACQ/66.
2023 ජුනි මස 21 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහ ලේකම් කාර්යාලය,
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිගම් කෝරළය සුළු කොට්ඨාසයේ, කලටියාවල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද: MA/WLG/2021/106 හි කැබලි අංක A හා 2021.07.20 දිනැති ප්‍රගමන අනුරේඛණයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කොටසට මායිම්:

**01. කැබලි අක්ෂර 'A' – බිස්සව්ලවත්ත - ප්‍රමාණය: හෙක්. 2.0390**

උතුරට: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) ක.සි. 820068 කලාප 1 කැබලි අංක 72, 74, 75, 76, 77, 78, 79, 80, 81, 82, 83, 84, 85, 86, 87, 88, 89 සහ 90; නැගෙනහිරට: එම්. කේ. උදයපාල සහ එස්. විදානගමාච්චි හිමිකම් කියන බිස්සව්ලවත්ත; දකුණට: ක.සි. 820068 කලාප 1 කැබලි අංක 128, 127 සහ 125; බටහිරට: ක.සි. 820068 කලාප 1 කැබලි අංක 125, 124 සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය).

EOG 07 – 0233